සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| තෙවන වාර පරීක්ෂණය 2020 | 11 ශ්‍රේණිය |
| மூன்றாம் தவணைப் பரீட்சை 2020 | தரம் 11 |
| **Third Term Test 2020** | **Grade 11** |

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | II | පැය දෙකයි |
| புவியியல் | II | இரண்டு மணித்தியாலம் |
| **Geography** | **II** | ***Two hours*** |

- **I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **II කොටසේ ප්‍රශ්න වලින් 4 කට පිළිතුරු සැපයිය යුතුය.**

**I කොටස**

**01. (අ)** ඔබ වෙත සපයා ඇති 1 : 50000 සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක I සිට V දක්වා අසා ඇති ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු වරහන් තුලින් තෝරා ලියන්න.

**(i)** අංක 01 න් දක්වා ඇති භෞතික ලක්ෂණය කුමක්ද?
(ගං දඟරය, හැඩපලු ගඟ, දිය බෙත්ම) **(ල. 01)**

**(ii)** අංක 02 න් දක්වා ඇති පරිපාලන මායිම කුමක්ද?
(පළාත් මායිම, දිස්ත්‍රික්ක මායිම, උප දිසාපති කොට්ඨාස මායිම) **(ල. 01)**

**(iii)** අංක 03 න් දක්වා ඇති ගංගාව ආශ්‍රිත ලක්ෂණය කුමක් ද?
(ගං දඟරය, අතු ගංගාව, පෝෂක ප්‍රදේශය) **(ල. 01)**

**(iv)** අංක 04 න් දක්වා ඇති වගාව කුමක් ද?
(ගෙවතු වගාව, රබර් වගාව, වෙනත් වැවිලි) **(ල. 01)**

**(v)** අංක 5 න් දක්වා අති මාර්ග වර්ගය කුමක් ද?
(ප්‍රධාන මාර්ගය, අඩි පාර, කරත්ත පාර) **(ල. 01)**

**(vi)** දී ඇති සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන වගාවන් 2 ක් නම් කරන්න. **(ල. 02)**

**(vii)** ගංගාව මධ්‍යයේ කඩ ඉරි වලින් දක්වා ඇති ප්‍රදේශය හඳුන්වන ජලවහන ලක්ෂණය කුමක්ද? **(ල. 01)**

**(viii)** සිතියම් ප්‍රදේශයේ මාර්ග ව්‍යාප්තිය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 02)**

ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(i)** A, B හා C අක්ෂර අතුරෙන් ඔකොට්ස් මුහුද දැක්වෙන අක්ෂරය කුමක් ද?

**(ii)** D, E හා F යන අක්ෂරවලින් ද්විතීක ජන සංකේන්ද්‍රණ නගරයක් වූ රියෝද ජැනෙයිරෝ නගරය දැක්වෙන අක්ෂරය කුමක් ද?

**(iii)** G, H හා J යන අක්ෂරවලින් දැක්වෙන කඳුවැටි අතරින් ඩ්‍රැකන්ස්බර්ග් කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

**(iv)** K හා L, M ය අක්ෂර වලින් දැක්වෙන තැනිතලා අතරින් මැන්චූරියානු තැන්න දැක්වෙන අක්ෂරය කුමක් ද?

**(v)** O, P හා Q යන අක්ෂර වලින් ලෝකයේ වී වගා කරන ප්‍රදේශ අතරින් සැක්‍රමැන්ටෝ නිම්නය දැක්වෙන අක්ෂරය කුමක් ද? **(ලකුණු 05)**

(ඇ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(i)** A, B හා C අක්ෂර අතුරෙන් ශ්‍රී ලංකාවේ මැණික් ලැබෙන ප්‍රදේශයක් වන ඔක්කම්පිටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

**(ii)** D, E හා F යන අක්ෂර වලින් අධික ලෙස ගංවතුර තර්ජනයට මුහුණ දෙන නිල්වලා ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

**(iii)** G, H හා J යන අක්ෂර වලින් දක්වා ඇති දිස්ත්‍රික්ක තුන අතරෙන් සේනානායක සමුද්‍රය පිහිටා ඇති දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?

**(iv)** K, L හා M යන අක්ෂර අතුරෙන් ශ්‍රී ලංකාවේ බෝල මැටි දක්නට ලැබෙන ඔඩ්ඩුසුඩාන් දක්නට ලැබෙන අක්ෂරය කුමක්ද?

**(v)** O, P හා Q යන අක්ෂර අතරින් සූර්ය ශක්ති බලාගාරයක් වන බරුතකන්ද සූරිය බලාගාරය දැක්වෙන අක්ෂරය කුමක් ද? **(ලකුණු 05)**

## II කොටස

---

**02.**




**(i)** රූප සටහනේ A හා B අක්ෂර වලින් දක්වා ඇති ස්ථාන දෙක අනුපිළිවෙලින් නම් කරන්න. **(ල. 02)**

**(ii)** A හා C අක්ෂර වලින් දක්වා ඇති ස්ථාන සමන්විත වන ප්‍රධාන පාෂාණ වර්ග 2 නම් කරන්න. **(ල. 02)**

**(iii)** ශිලා ගෝලයෙන් මිනිසාට ලැබෙන ප්‍රයෝජන 3 ක් සඳහන් කරන්න. **(ල. 03)**

**(iv)** ශිලාගෝලයේ ඇති සම්පත් මිනිසා විසින් ප්‍රයෝජනයට ගැනීමේ දී ශිලාගෝලයට විවිධ බලපෑම් ඇති වේ. එලෙස බලපෑම් සිදුවන අවස්ථා 2 ක් ලියා 1 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 03)**

**03. (i)** ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් භාවිත වන බලශක්ති මූලාශ්‍ර 2 ක් නම් කරන්න. **(ල. 02)**

**(ii)** බලශක්තිය පරිහරණයේ දී මතුවන ගැටලු 3 ක් සඳහන් කර එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 05)**

**(iii)** බලශක්ති සම්පත් සංරක්ෂණය කිරීම සඳහා ඔබ විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 3 ක් සඳහන් කරන්න. **(ල. 03)**

**04.**




**(i)** A හා B අක්ෂරවලින් දක්වා ඇති ලෝකයේ භූමිකම්පා සිදුවන ප්‍රධාන කලාප 2 නම් කරන්න. **(ල. 02)**

**(ii)** භූමිකම්පාවක් ඇතිවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 03)**

**(iii)** භූමිකම්පාවලින් ඇතිවන බලපෑම් 3 ක් සඳහන් කර 1 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 05)**

**05. (i)** ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ගෘහ කර්මාන්ත 4 ක් සඳහන් කරන්න. **(ල. 02)**

**(ii)** ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 3 ක් සඳහන් කරන්න. **(ල. 03)**

**(iii)** ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්තය ආශ්‍රිත ව ඇතිවන ගැටලු 3 ක් සඳහන් කර 2 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 05)**

**06. (i)** ලෝකයේ ප්‍රධාන වනාන්තර වර්ග 3 නම් කරන්න. **(ල. 03)**

**(ii)** එයින් එක් වනාන්තර වර්ගයක දක්නට ලැබෙන ලක්ෂණ 2 ක් සඳහන් කරන්න. **(ල. 02)**

**(iii)** නිවර්තන වර්ෂා වනාන්තර විනාශ වීමට බලපාන හේතු 2 ක් සඳහන් කරන්න. **(ල. 02)**

**(iv)** වනාන්තර හා වනජීවීන් මුහුණපාන ගැටලු 2 ක් සඳහන් කර එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 03)**

**07. (i)** ශ්‍රී ලංකාවේ තේ වගාවට අවශ්‍ය භෞතික සාධක 2 ක් සඳහන් කරන්න. **(ල. 02)**

**(ii)** ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක 3 ක් නම් කරන්න. **(ල. 03)**

**(iii)** ශ්‍රී ලංකාවේ තේ වගාව දියුණු කිරීමෙන් ආර්ථිකයට ලබාගත හැකි ප්‍රයෝජන 3 ක් සඳහන් කර 1 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 05)**

**08. (i)** ශ්‍රී ලංකාව සතු ප්‍රධාන ස්වාභාවික සම්පත් 4 ක් නම් කරන්න. **(ල. 02)**

**(ii)** ශ්‍රී ලංකාවේ භූමිය විවිධ අයුරින් පරිහරණයට ගෙන ඇත. එයට අදාළ උදාහරණ 3 ක් දෙන්න. **(ල. 03)**

**(iii)** ශ්‍රී ලංකාවේ භූමිය පරිහරණය හා සම්බන්ධ ගැටලු 3 ක් සඳහන් කර එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල. 05)**